

CareerMe®

Sri Lanka's Pioneer in Professional Career Guidance

# වෘත්තීය පරීක්ෂණ ප්‍රතිඵල

පුද්ගලිකයි. රහසිගතයි.

SAMPLE TEST සඳහා සකස් කරන ලදී.

ලබා ගත් දිනය : Jul 18 2019

ලිපිනය - 36 Haig Road, Colombo 04, Sri Lanka

# මෙම වාර්තාව පිළිබඳ

මෙම ඇගයීම CareerMeහි නිමැවුමක් වේ. එමගින් ඔබේ පුද්ගලික ශක්තීන්, කුසලතා හා විභව්‍ය වෘත්තීය ලැදියාවන් හඳුනා ගැනීම සඳහා මනෝමිතික ක්‍රියාමාර්ග භාවිතා කරයි. මෙම වාර්තාව සමග රැකියාවන් සහ ඔබේ ලැදියාවන් ගැලපීමේ ගමන ආරම්භ විය හැකිය.

වෙනත් දත්ත මූලාශ්‍ර සමග යොදා ගන්නා විට මෙම වාර්තාව ඔබට අගනා සහායක් වනු ඇත. එය තනිව භාවිතා කිරීමට අදහස් නොකෙරේ. ඔබේ ප්‍රතිඵල ඔබට වැදගත් වන පුද්ගලයන්, එනම් ඔබේ පවුල හා වෘත්තීය උපදේශකවරයා සමග සාකච්ඡා කිරීමට අවශ්‍ය කාලය ලබා ගන්න. මෙහි ඇති එක් ප්‍රබල වාසියක් වන්නේ ඔබ විසින් පසු විපරම් කළ යුතු ඔබේ ශක්තීන්ට අදාළ ක්ෂේත්‍ර හඳුනාගත හැකි වීමයි.

ඔබේ පුද්ගලිකකරණය කරන ලද වාර්තාව කොටස් තුනකට වෙන් කෙරේ. පළමු කොටස රැකියා ස්ථානයේ ඔබේ පෞරුෂත්වය පිළිබඳ විස්තර කෙරෙන පුද්ගල පෞරුෂය වේ. දෙවන කොටස ඔබේ රැකියාවෙහි විභව්‍ය මනාපයන් පිළිබඳ සාරාංශයක් වන එය වාර්තා කර ඇති රුචිකත්වයන් මත පදනම් වේ. අවසාන වශයෙන් මෙම වාර්තාව මගින් අපේක්ෂා කරන රැකියාවන් වෙත ළඟා වීම සඳහා සැලැස්මක් තෝරා ගැනීම හා සකස් කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර නිර්දේශ කෙරේ.

ප්‍රශ්නාවලිය සඳහා අවංකව පිළිතුරු සැපයූවේ නම් වාර්තාව ඉහළ මට්ටමේ නිරවද්‍යතාවක් පෙන්නුම් කරයි. කෙසේවුවද, හිතාමතා රැවටීමට උත්සාහ කළහොත් එය වලංගු නොවේ. මෙම වාර්තාව නිර්මාණය කර ඇත්තේ ඔබේ රැකියා අවස්ථාවන් පුළුල් කිරීම හා ඔබේ රුචිකත්වයන්ට ගැලපෙන මාර්ග රැසක් ගවේශණය කිරීමේ අවස්ථාව ඔබට සලසා දීම සඳහාය.

# පටුන


| මාතෘකාව | පිටු අංකය |
|---|---|
| 1. ඔබේ පුද්ගලික තොරතුරු ...................................................................................................... | 1 |
| 2. ඔබේ වෘත්තීය පැතිකඩ ......................................................................................................... | 2 |
| 3. ඔබේ රුචිකත්වය පිළිබඳ කේතය ........................................................................................... | 3 |
| 4. රැකියාවට අදාළ රුචිකත්වයන් ............................................................................................. | 4 |
| 5. ඔබේ මීළඟ පියවර ................................................................................................................ | 5 |

# 01 ඔබේ පුද්ගලික විස්තර

## පුද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| හැඳුනුම් අංකය: | 0004 | නම: | SAMPLE TEST |
| උපන්දිනය: | 10 Oct 1990 | වයස: | 28 |
| ස්ත්‍රී පුරුෂ භාවය: | පිරිමි | ජංගම දුරකථන අංකය: | 1234567890 |
| විද්‍යුත් තැපැල: | example@example.com | ජාතික හැඳුනුම්පත් අංකය: | |
| පදිංචි දිස්ත්‍රික්කය: | කොළඹ | ඉහළම අධ්‍යාපනය: | වෘත්තීය සුදුසුකම් |
| ඔබ? | පාසල් ශිෂ්‍යයා | ඔබ සොයන්නේ? | පුහුණු පාඨමාලාවක් |

## අමතර තොරතුරු

| | | | |
|---|---|---|---|
| අධ්‍යාපනය සඳහා ඔබට ණයක් අවශ්‍යද? | ඔව් | ඔබ පදිංචි ස්ථානයෙන් පිටත රැකියාව කිරීමට කැමතිද? | ඔව් |
| ඔබ සීමාවාසික පුහුණුවක් සඳහා කැමතිද? | නැත | නොමිලේ වෘත්තීය පාඨමාලාවක් හැදෑරීමට ඔබ කැමතිද? | ඔව් |
| ඔබ විදේශ රැකියාවලට කැමතිද? | ඔව් | ඔබ විදෙස් අධ්‍යාපනය ලැබීමට කැමතිද? | ඔව් |
| ඔබ පෞද්ගලික විශ්ව විද්‍යාලයකින් අධ්‍යාපනය ලැබීමට කැමතිද? | ඔව් | | |

## ඔබේ ඉංග්‍රීසි භාෂා කුසලතා කොතරම් හොඳද?

**කියවීම : මූලික** **ලිවීම: අතරමැදි** **කතා කිරීම: ප්‍රවීණ**

## ඔබ උනන්දුවක් දක්වන කර්මාන්ත

ඉදිකිරීම තොරතුරු තාක්ෂණ

## 02 ඔබේ වෘත්තිය පැතිකඩ

අපගේ රැකියාව පිළිබඳ පරීක්ෂණය මගින් රුචිකත්වයන් වර්ග 6ක් පිළිබඳ මැන බලනු ලැබේ: එනම් යථාර්ථවාදී (R), විමර්ශනාත්මක (I), කලාත්මක (A), සමාජශීලී (S), උත්සාහවන්ත (E) හා සාම්ප්‍රදායික (C). මෙම ක්ෂේත්‍ර 6 සඳහා ඔබේ මුළු ලකුණු සංඛ්‍යාව පහත දැක්වේ. ඉහළම ලකුණු ලබා ඇති රුචිකත්වයන් තුන රැකියාවට අදාළ ඔබේ පෞරුෂත්ව ආකාරය ලබා ගැනීම සඳහා භාවිතා කෙරේ. මෙය රුචිකත්වය පිළිබඳ කේතය (Interest Code) නමින් හඳුන්වන අක්ෂර තුනේ කේතයක් ලෙස ඉදිරිපත් කෙරේ. පරීක්ෂණයේ එක් එක් කොටසට අදාළ ලකුණු ප්‍රමාණය පිටුවේ පහළ කෙළවරේ දැක්වේ.

52% යථාර්ථවාදී

56% විමර්ශනාත්මක

57% කලාත්මක

69% සමාජශීලී

55% උත්සාහවන්ත

72% සාම්ප්‍රදායික



මෙහි ක්ලික් කිරීමෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර ගැන කියවන්න.

## ඔබේ රුචිකත්වය පිළිබඳ කේතය

සාම්ප්‍රදායික - C - 72%

සමාජශීලී - S - 69%

කලාත්මක - A - 57%

ඔබේ ඉහළම රුචිකත්වය සහිත ක්ෂේත්‍රය සාම්ප්‍රදායික ක්ෂේත්‍රය වන අතර සමාජශීලී හා කලාත්මක ක්ෂේත්‍රයන් ද ඉන් පසුව ලැදියාව සහිත ක්ෂේත්‍රයන් වේ.

**එක් එක් කොටසට අදාළ පරීක්ෂණ ලකුණු සටහන**

| ලකුණු | R | I | A | S | E | C |
|---|---|---|---|---|---|---|
| ඔබ? | 38% | 33% | 58% | 63% | 58% | 58% |
| ඔබට හැකිද? | 42% | 42% | 42% | 71% | 42% | 71% |
| ඔබ කැමතිද? | 75% | 75% | 79% | 79% | 63% | 79% |
| සිත් ගන්නා සුළු රැකියාවන් | 54% | 75% | 50% | 63% | 58% | 79% |
| මුළු ලකුණු ප්‍රතිශතය | 52% | 56% | 57% | 69% | 55% | 72% |

# 03 ඔබේ උනන්දුව දක්වන කේත පැහැදිලි කිරීම

## සාම්ප්‍රදායික

ඔබේ වෘත්තීය පෞරුෂත්ව වර්ගය ඉහත උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර තුනෙහි එකතුවකි. ඔබගේ ඉහළම උනන්දුව දක්වන ප්‍රදේශයට (සාම්ප්‍රදායික) අදාළව ඔබේ පෞරුෂත්වය පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් පහතින් දැක්වේ. ඔබගේ විශේෂිත අභිරුචි සංයෝජනය වඩාත් විස්තරාත්මකව අවබෝධ කර ගැනීම සඳහා අපගේ වෘත්තීය උපදේශක සමඟ කතා කරන්න.

### සංවිධායකයන්

#### ලක්ෂණ

ඔබ සංවිධානාත්මක, ප්‍රවේශම්සහගත හා කාර්යක්ෂම අයෙකි. ඔබ ව්‍යුහාත්මක කටයුතු, අනුකූලතාව හා විශ්වසනීයත්වය අගය කරයි. ඔබ නිවැරදි වන අතර මනාව අර්ථ දැක්වූ කාර්යයන් හා පිළිවෙලට කැමති අයෙකි. එබැවින් ඔබට විශාල සංවිධාන තුළ හොඳින් කටයුතු කළ හැකිය. ඔබ නායකත්වය ලබා දීමට උත්සාහ කරන්නේ කලාතුරකින් වන නමුත් කාර්යයන් ඉටු කිරීමේ දී ඔබ මනාව, නොපිරිහෙලා, විශ්වසනීය ලෙස සිදු කරයි. ඔබ විසින් ඔබව හඳුනා ගන්නේ වගකීම්සහගත, පිළිවෙල සහිත හා ලේඛන, සංවිධානාත්මක හා ගණිතමය හැකියාවන්ගෙන් යුතු අයෙකු ලෙසයි.

#### කැමති

ඔබ ඔබේ වැඩ කරන ස්ථානයේ කටයුතු බාධාවනික් තොරව පවත්වාගෙන යාම සඳහා පැහැදිලිව අර්ථ දක්වා ඇති ක්‍රියාපරිපාටීන් හා නීති සහ රෙගුලාසි කෙරෙහි කැමැත්තක් දක්වයි. ඔබ මිනිසුන්ට වඩා දත්ත හා භෞතික දේ කෙරෙහි කැමැත්තක් දක්වයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඔබ කඩදාසි හා පරිගණක මත පදනම් වූ ව්‍යාපාරික අංග එනම් ගිණුම්කරණය, සටහන් තැබීම හා දත්ත පිරිසැකසුම ආදිය සමග කටයුතු කිරීමට කැමැත්තක් දක්වයි.

#### අකමැති

ඔබ අපැහැදිලි, ව්‍යුහාත්මක නොවන කටයුතු, පුද්ගලාන්තර ගැටළු පිළිබඳ කටයුතු කිරීම සහ ඇඳීම හ වර්ණ ගැන්වීම වැනි ඉහළ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සිදු කිරීමට ඔබ කැමැත්තක් නොදක්වයි.

#### කුසලතා සහ ශක්තීන්

ඉලක්කම් සමග කටයුතු කිරීම, කාර්ය සටහන් සකස් කිරීම, තොරතුරු පිරිසැකසුම, විස්තර කෙරෙහි අවධානය යොමු කිරීම හා ව්‍යාපාරික ලේඛන කටයුතු ආදිය ඔබ තුළ වන ප්‍රභල හැකියාවන් වේ.

#### වෘත්තීන්

ඔබ සංවිධානාත්මක හැකියාවන් එනම් සටහන් තැබීම හා දත්ත කළමනාකරණය ආදිය කෙරෙහි අනුග්‍රහය දක්වන කාර්ය පරිසරයකට කැමැත්තක් දක්වයි. ඔබ විසින් සලකා බැලිය යුතු සාම්ප්‍රදායික රැකියාවන්වලට ගණකාධිකාරී, බැංකුකරු, කාර්යාල කළමනාකරු, ලේකම් හා පුස්තකාලයාධිපති ආදී වෘත්තීන් ඇතුළත්වේ.

#### අධ්‍යයනය කළ හැකි ක්ෂේත්‍ර

උපාධි අධ්‍යයනයන් සඳහා තෝරා ගත හැකි විෂය ක්ෂේත්‍ර ඔබට පහත විෂය ක්ෂේත්‍ර පිළිබඳ සලකා බැලිය හැකිය:

ව්‍යාපාර, ගිණුම්කරණය, කළමනාකරණය, මූල්‍ය හා රක්ෂණ සහ රාජ්‍ය පරිපාලනය.

මෙහි ක්ලික් කිරීමෙන් ඔබගේ වෙනත් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර ගැන කියවන්න.

## සමාජශීලී

සමාජශීලී පුද්ගලයෝ මානුෂවාදී, පරමාදර්ශී, වගකීම්සහගත හා අන් අයගේ සුභසාධනය පිළිබඳ අවධානය යොමු කරන්නන් වෙති. ඔවුහු කණ්ඩායම් ක්‍රියාකාරකම් හා අන්අයට උපකාර කිරීම, පුහුණු කිරීම, සුවපත් කිරීම, උපදේශනය හෝ සංවර්ධනය කෙරෙහි කැමැත්තක් දක්වති. සාකච්ඡා හෝ සබඳතා ප්‍රතිසංවිධානය කිරීම තුළින් ගැටළු විසඳීමට ඔවුහු කැමැත්තක් දක්වති. ඔවුන් වඩාත් දක්ෂ වන්නේ මානව සබඳතා සම්බන්ධයෙනි. සමාජශීලී රැකියාවන්වලට සමාජ සේවක, උපදේශක , ව්‍යාවෘතික චිකිත්සක, ගුරු, හෙද ආදී වෘත්තීන් ඇතුළත් වේ.

## කලාත්මක

කලාත්මක පුද්ගලයන් අද්විතීය, සහජ බුද්ධිය සහිත සහ චිත්තෝත්පාදක සහ සංගීත නිර්මාණය හෝ වාදනය, චිත්‍ර ඇඳීම සහ වේදිකා නාට්‍යවල රගපෑම හෝ වේදිකා නාට්‍ය නිෂ්පාදනය ආදී නිර්මාණශීලී ක්‍රියාකාරකම්වල නිරත වීමට කැමති අයයි. මෙම කාණ්ඩයට අයත් පුද්ගලයන් නම්‍යශීලීභාවයට, අපහැදිලිභාවයට කැමැත්තක් දක්වන අතර සාමප්‍රදායික හා යටත් වීමට අකමැති අයවේ. ඔවුන් වඩාත් දක්ෂ වන්නේ කලාව කෙරෙහිය. කලාත්මක රැකියාවන්වලට සංගීතඥයා, කලාකරුවා, ගෘහ අභ්‍යන්තර අලංකරණ ශිල්පී, ග්‍රැෆික් ශිල්පී, නළුවා හා ලේඛක ආදී වෘත්තීන් අතුළත් වේ.

## 04 රැකියාවට අදාළ රුචිකත්වයන්

ඔබේ රුචිකත්වයන්ට අදාළ ක්ෂේත්‍ර තුනම සම්බන්ධ වන කටයුතු සැලකිල්ලට ගෙන ඔබට ගැලපෙන විභව්‍ය රැකියාවන් සොයාගන්න. සාම්ප්‍රදායික – සමාජශීලී – කලාත්මක යන සංකලනය යටතේ වන රැකියාවන් කිහිපයක් පහත දැක්වේ. .

| කේතය | රැකියාව | අවම නිපුණතා මට්ටම |
|---|---|---|
| CS | වෛද්‍ය ලේකම්වරුන් | ඩිප්ලෝමාව හෝ උසස් ඩිප්ලෝමාව |
| SC | ගුරු සහායකයන් | ඩිප්ලෝමාව හෝ උසස් ඩිප්ලෝමාව |
| SAC | මූලික පාසල් ගුරුවරුන් ✱ | උපාධිය හෝ වෘත්තීය සුදුසුකම් |
| SC | උපාධිධාරී ගුරු සහකාර ✱ | පශ්චාත් උපාධි |
| SC | කථන භාෂා ව්‍යාධිවේද සහකාර | ඩිප්ලෝමාව හෝ උසස් ඩිප්ලෝමාව |
| SAC | පුහුණු හා සංවර්ධන විශේෂඥයින් | උපාධිය හෝ වෘත්තීය සුදුසුකම් |
| SAC | වෘත්තීය/ කාර්මික අධ්‍යාපන ගුරුවරුන් | උපාධිය හෝ වෘත්තීය සුදුසුකම් |

## 05 ඔබේ මීළඟ පියවරයන්

රැකියා ලෝකය තුළට ඇතුළත් වීම අභියෝගාත්මක ක්‍රියාවලියක් වේ. තෝරා ගැනීමට රැකියාවන් රැසක් වන නමුත් ඔබේ රුචිකත්වයන්ට ගැලපෙන්නේ ඒ අතරින් කිහිපයක් පමණි. රැකියාවක් පිළිබඳ තීරණයක් ගත් පසුව එම රැකියාව ලබා ගැනීම සඳහා ඔබේ අධ්‍යාපනික විකල්පයන් හඳුනා ගැනීම ද අවශ්‍ය වේ.

රැකියාවක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු ප්‍රශ්න කිහිපයක් පහතින් දැක්වේ.

**1). රැකියාව සඳහා සාමාන්‍ය වැඩ කරන සතියක් වන්නේ කුමක්ද?**
**2). අවම අධ්‍යාපනික අවශ්‍යතාවන් මොනවාද?**
**3). රැකියාවෙහි වාසි හා අවාසි මොනවාද?**
**4). මෙම රැකියාව මගින් මාගේ අවශ්‍යතා ඉටු වේද? (මුදල්, සබඳතාවන්, පුද්ගලික සංවර්ධනය, බලාපොරොත්තු ආදිය.)**

සෑම කෙනෙකුටම මෙම ගැටළු ඇති අතර සෑම කෙනෙකුටම සහාය මගින් ප්‍රතිලාභ සලසා ගත හැකිය. මෙම ක්‍රියාවලියේදී ඔබට සහාය වීම සඳහා අපගේ වෘත්තීය උපදේශකවරයෝ පූර්ණ සූදානමින් පසුවෙති.




**පරීක්ෂණයට මුහුණ දෙන්න**

**උපදේශකවරයා හමුවන්න**

**වෘත්තීය ක්‍රියාකාරී සැලැස්ම (ආදර්ශය බලන්න)**

ඉහතින් දක්වා ඇත්තේ CareerMe මාර්ගෝපදේශ ක්‍රියාවලියෙහි නිදර්ශනයකි. පළමු පියවර සම්පූර්ණයි. මෙම වාර්තාවේ පූර්ණ ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා ඔබ පිළිබඳ හා ඔබ විසින් සලකා බැලිය යුතු අධ්‍යාපන හා වෘත්තීය තෝරා ගැනීම් පිළිබඳ වැඩිදුර අවබෝධයක් ලබා ගැනීමටත් අපගේ උපදේශකවරයා හමු වීම ඵලදායක වනු ඇත.

උපදේශකවරයා හමුවන්න

අපගේ ක්ෂණික ඇමතුම් අංකය වන 0779798480 ට ඇමතීමෙන් හෝ info@careerme.lk වෙත ඊ මේල් පණිවිඩයක් එවීමෙන් ඔබට වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය

වියාචනය: මෙම ලේඛනයේ අරමුණ ස්ව අවබෝධය ලබා ගැනීමයි. එය සකස් කර ඇත්තේ පුද්ගලයන්හට තමන්ගේ ස්වභාවික පෞරුෂත්ව ශක්තීන් සහ වෘත්තීය රුචිකත්වයන්, කුසලතා සහ අගයන් හඳුනා ගැනීම සඳහාය. පරීක්ෂණ ප්‍රතිඵල මානසික සෞඛ්‍ය, හා/හෝ වෛද්‍ය ගැටළු හඳුනා ගැනීම, රෝග විනිශ්චය, හෝ ප්‍රතිකාර කිරීම සඳහා යොදා නොගත යුතුය. ස්ව අවබෝධය සඳහා මෙම සහාය ලබා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු කරන ක්‍රියාවන් හෝ ගනු ලබන තීරණ කෙරෙහි පූර්ණ වගකීම පරිශීලකයා විසින් දැරිය යුතුය. මෙම ඇගයුම භාවිතා කිරීමෙන් හෝ එය භාවිතා කිරීමට අදාළව පැන නගින, CareerMe හි හිමිකරුවා වන සීමාසහිත Ednext Analytics පුද්ගලික සමාගම, අනුබද්ධිත ආයතන හෝ පාසල්, හා/හෝ ඒවායේ සේවකයන්, කෙරෙහි වන ඕනෑම හා සියළු ආකාරයේ හිමිකම් CareerMe මාර්ගගත ඇගයුම භාවිතා කිරීම මගින් ඔබ විසින් අත්හරිනු ලැබේ.